# AIA ස්මාර්ට් වෙල්ත්

## ඔබගේ ධනය ගොඩනගන කළමනාකරණය කරන සහ සුරක්ෂිත කරන සැලසුමක්



HEALTHIER, LONGER, BETTER LIVES

# ඔබ සිහින මවන්නේ

- ධනය ගොඩනැගීමටද ?
- දැනටමත් ඔබ සතු ධනය කළමනාකරණය කරගනිමින් සුරක්ෂිත කරගැනීමටද ?
- ඔබගේ ධනය යොදා ගනිමින් ආදරණීයයන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමට ද ?

නිදහස්, ප්‍රීතිමත් විශ්‍රාම දිවියක් සඳහා





අනාගත අභිලාෂයන් සහ අපේක්ෂාවන් සඳහා

**ඔබේ ධනය අද මෙන්, අනාගතයේදීත් ඔබට අතිශයින් වැදගත් වනු ඇත**



මූල්‍ය සුරක්ෂිතතාවය සඳහා



ඔබගේ උරුමය ගොඩනැගීම සඳහා



ඔබේ දරුවාගේ අධ්‍යාපනය සඳහා

ධනය ගොඩනැගීම ඉතා වැදගත්. නමුත් එසේ ගොඩනැගෙන ධනය "කළමනාකරණය" සහ"සුරක්ෂිත කිරීම" සඳහා නිවැරදි විකල්ප හා ඒවායේ නිවැරදි සංයෝජනය තෝරා ගැනීමද ඒ හා සමානව වැදගත්.




මෙම සියලු විකල්ප, එකිනෙකට වෙනස් වූ "ප්‍රතිලාභ" සහ "සුරක්ෂිතතාවයන්" සලසා දෙනු ඇත. එබැවින් ඒ ඒ විකල්ප තුලින් ලැබෙන ප්‍රතිලාභ සහ සුරක්ෂිතතාවයන් සසඳමින් මනා විශ්ලේෂණයක් කිරීම ඉතා වැදගත්.

අප දන්නවා ඔබගේ ආදරණීයයන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් ඔබ ධනය ගොඩනගන බව. ඒ ඔවුන්ගේ අනාගතය මූල්‍යමය වශයෙන් සුරක්ෂිත කිරීමටයි. ඒ නිසා, ඔබ නොමැති කලකදී පවා ඔබගේ ධනය ගොඩනගමින් සුරක්ෂිත කරන හොඳම විකල්පය ඔබ විසින් තෝරා ගත යුතුයි.

පහත වගුවේ ඇති සංසන්දනය, ඔබේ මුදල් නැණවත්ව ආයෝජනය කළ හැකි ආකාරය පිළිබඳ පුළුල් දැක්මක් ලබා දේ.

## විකල්ප සංසන්දනය කිරීම







| ධනය ගොඩනැගීම, කළමනාකරණය සහ සුරක්ෂිත කිරීම සඳහා ඇති විකල්ප | ප්‍රතිලාභ | සුරක්ෂිතතාවය | ජීවිත ප්‍රතිලාභය |
|---|---|---|---|
| ස්ථාවර තැන්පතු |  |  | ✗ |
| ඉතුරුම් |  |  | ✗ |
| දේපළ |  |  | ✗ |
| කොටස් වෙළෙඳපොළ |  |  | ✗ |
| ව්‍යාපාරයක් ආරම්භ කිරීම |  |  | ✗ |
| රත්‍රන්වල ආයෝජනය |  |  | ✗ |
| ආයෝජකයෙකු වීම |  |  | ✗ |
| ජීවිත රක්ෂණය |  |  | ✓ |

සටහන: මෙම සංසන්දනය සකස් කර ඇත්තේ 2021 අප්‍රේල් මාසය වනවිට පවතින පොලී/ලාභාංශ අනුපාත, වටහාගත් අවදානම්, වෙළෙඳපොළ වටිනාකම්, මහජන ආකල්ප වැනි කාරණා ආශ්‍රිතව පවතින වෙළෙඳපොළ සංඛ්‍යාලේඛන යොදා ගෙන කරන ලද මූලික සමීක්ෂණ මතය.

"ප්‍රතිලාභ" සහ "සුරක්ෂිතතාවය" අතර නිසි සමබරතාවයක් සලසමින්, ඔබ නොමැති කලකදී වුවද, ඔබේ ධනය ගොඩනගමින් හා එය සුරක්ෂිත කරන එක් විකල්පයක් ඇත. එමෙන්ම "ප්‍රතිලාභ" සහ "සුරක්ෂිතතාවයට" අමතරව ජීවිත ප්‍රතිලාභයක් සහිත එකම ආයෝජන විකල්පය "ජීවිත රක්ෂණයයි". මෙමගින් ඔබ නොමැති විටකදී පවා ඔබගේ ධනය සුරක්ෂිත කරමින්, ඔබගේ ආදරණීයයන්ගේ මූල්‍යමය සුරක්ෂිත බව තහවුරු කරයි.

# අනෙකුත් ආයෝජන විකල්ප අතරින් ඔබ AIA ඉන්ෂුවරන්ස් තෝරා ගත යුත්තේ ඇයි?

## ප්‍රතිලාභ

AIA විසින් රක්ෂණ ඔප්පු හිමියන්ට වසර ගණනාවක් පුරාවට පොරොන්දු වුවාට වඩා ආකර්ෂණීය ලාභාංශ අඛණ්ඩව ලබා දී ඇත. මෙය AIA ආයෝජන ක්‍රමෝපායයන්හී ගුණාත්මකභාවය පිළිබඳ පැහැදිලි සාක්ෂියක් වේ.




## සුරක්ෂිතතාවය

ඔබ ගෙවන වාරික, ශ්‍රී ලංකාවේ රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිපාලන නීති යටතේ කළමනාකරණය කරන "ජීවිත අරමුදල" නම් වූ සුරක්ෂිත අරමුදලක ආයෝජනය කරනු ලැබේ.

AIA හි අපි, අපගේ ආයෝජන බොහොමයක් රජයේ බැඳුම්කර සහ ඉහළ තත්ත්වයේ මූල්‍ය අරමුදල් වල පවත්වාගෙන යන්නෙමු.

AIA හි දූරදර්ශී ආයෝජන උපායමාර්ග සැලසුම් කර ඇත්තේ අපගේ රක්ෂණ ඔප්පු හිමියන්ගේ මුදල්වල සුරක්ෂිතතාවය සහ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා වන අතර එමගින් දිගු කාලීනව ඉහළ ප්‍රතිලාභ ලබා දෙනු ඇත. ඔබේ අරමුදල්වල සුරක්ෂිතතාවය හා ඉහළ ප්‍රතිලාභ සහතික කිරීම සඳහා ඔබේ අරමුදල් අප විසින් මනාව කළමනාකරණය කරනු ලැබේ.

## ජීවිත ප්‍රතිලාභය

ජීවිත ප්‍රතිලාභයක් ලබා දෙන එකම ආයෝජන විකල්පයයි.

අඛණ්ඩව 2019 සහ 2020 වර්ෂවල දී "ශ්‍රී ලංකාවේ හොඳම ජීවිත රක්ෂණ සමාගම" ලෙස AIA පිළිගැනීමට පාත්‍ර විය.*

ආසියා පැසිෆික් කලාපයේ වසර 100 කට වැඩි ඉතිහාසයක්.

ලොව පුරා ජීවිත රක්ෂණ සැලසුම් මිලියන 34 ක්.

සටහන් : ඉහත දැක්වෙන්නේ දැනට අලෙවි වන ජීවිත රක්ෂණ සැලසුම් සඳහා අදාළ වන රක්ෂණ කොන්දේසිවලට අනුකූලව AIA ඉන්ෂුවරන්ස් හි රක්ෂණ සැලසුම් සඳහා හිමි ආයෝජන ප්‍රතිලාභයෙන් 75%ක ප්‍රතිශතයකට අනුව ප්‍රකාශ කරන ලද දළ ලාභාංශ අනුපාතයයි. අතීත ක්‍රියාකාරීත්වය, අනාගත කාර්ය සාධනය පිළිබඳ දර්ශකයක් නොවන බව කරුණාවෙන් සලකන්න.

* "ග්ලෝබල් බෑන්කින් ඇන්ඩ් ෆිනෑන්ස් රිවිව්" විසින් ප්‍රදානය කරන ලදී.



# AIA ස්මාර්ට් වෙල්ත්

**ඔබේ ධනය ගොඩනැගීමට සහ සුරක්ෂිත කිරීමට, ඔබට හඳුන්වාදෙන AIA ස්මාර්ට් වෙල්ත් - සුරක්ෂිත ආයෝජන ප්‍රතිලාභ සහිත විශිෂ්ට ජීවිත රක්ෂණ සැලසුමක්.**

**මෙය ඔබගේ ධනය ගොඩනැගීමට, කළමනාකරණය කිරීමට සහ සුරක්ෂිත කිරීමට උපකාරී වන නම්‍යශීලී සැලැස්මක්.**

## AIA ස්මාර්ට් වෙල්ත් මගින් ලැබෙන ප්‍රතිලාභ...!



ජීවිත ප්‍රතිලාභ



වාර්ෂිකව සහතික කළ ලාභාංශ



වටිනා ලෝයල්ටි දීමනා සමගින් කල්පිරීමේදී විශාල අරමුදලක්



කෙටි කාලීන වාරික ගෙවීමක්, දිගු කාලීන රැකවරණයක්



කල්පිරීමේ අරමුදල් ලබා ගැනීමේ විකල්ප



හදිසි අවස්ථාවකදී මුදල් ආපසු ගැනීමේ හැකියාව



වර්ධනය වන මාසික ආදායමක්



වාරික ආරක්ෂණ ප්‍රතිලාභය



ලාභාංශ වර්ධකය



හදිසි අනතුරු ප්‍රතිලාභය



නිත්‍ය පූර්ණ අකර්මන්‍යතා ප්‍රතිලාභය



## ඔබ දන්නවාද?

AIA ස්මාර්ට් වෙල්ත්, ඔබේ ධනය ගොඩනගනවා පමණක් නොව එය කළමනාකරණය කිරීමට සහ සුරක්ෂිත කිරීමට ද උපකාරී වන බව.

# AIA ස්මාර්ට් වෙල්ත් ඔබට සුදුසුම විසඳුම වන්නේ ඇයි?

ඔබේ ධනය ක්‍රම 3ක් යටතේ ගොඩනැගීමට හා වර්ධනය කිරීමට AIA ස්මාර්ට් වෙල්ත් ඔබට උපකාරී වේ.

## ධනය ගොඩනැගීමට



## ධනය කළමනාකරණය කිරීමට



## ධනය සුරක්ෂිත කිරීමට





## ධනය ගොඩනැගීම

- කෙටි කාලීන වාරික ගෙවීමක් (වසර 4 ක් හෝ 6 ක්).
- වසර 20 ක් දක්වා අරමුදලක් ගොඩනගා ගැනීමේ හැකියාවක්.
- වාර්ෂිකව සහතික කළ ලාභාංශ.
- රක්ෂණ ඔප්පු කාල සීමාව අවසානයේ දී විශාල අරමුදලක්.
- කල්පිරීමේ දී ඔබේ අරමුදල එකවර හෝ වසර 30 ක් දක්වා මාසික ආදායමක් ලෙස (නැතහොත් අරමුදලෙන් කොටසක් එකවර ලබාගෙන ඉතිරිය මාසික ආදායමක් ලෙස).
- 15 වන සහ 20 වන ඔප්පු වර්ෂ අවසානයේ දී ආකර්ෂණීය ලෝයල්ටි දීමනාවක් (වසර 10 සහ 15 ඔප්පු කාල සීමාවන් සඳහා කල් පිරීමේ දී මෙම ලෝයල්ටි දීමනා ගෙවනු ලැබේ).



## ධනය කළමනාකරණය කිරීම

- ඉහළ ප්‍රතිලාභ සහිත සුරක්ෂිත අරමුදලක් ලබා දීම සඳහා ඔබේ අරමුදල් මනා ලෙස කළමනාකරණය කිරීම.
- ඔබේ අරමුදලින් වැඩි ප්‍රමාණයක් රජයේ බැඳුම්කර සහ ඉහළ පිළිගැනීමක් ඇති සුරක්ෂිත මූල්‍ය විකල්පවල ආයෝජනය කිරීම.
- විචක්ෂණශීලී සහ සුරක්ෂිත ආයෝජන.
- ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ සමාගම් අතරින් විශාලතම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ ප්‍රතිශතය (Capital Adequacy Ratio).



## ධනය සුරක්ෂිත කිරීම

- ඔබේ මුළු වාර්ෂික වාරිකය මෙන් 5 සිට 50 ගුණයක් දක්වා වූ ජීවිත ප්‍රතිලාභයක්. ඔබ අවාසනාවන්ත ලෙස වියෝවුවහොත්, ඔබගේ ආදරණීයයන්ට මෙම ජීවිත ප්‍රතිලාභය හිමි වනු ඇත.
- හදිසි අනතුරක් හේතුවෙන් අවාසනාවන්ත වියෝවීමක දී හදිසි අනතුරු ප්‍රතිලාභය හිමි වනු ඇත.
- හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන නිත්‍ය පූර්ණ අකර්මන්‍යතා හෝ නිත්‍ය අර්ධ අකර්මන්‍යතා සඳහා මූල්‍ය ආවරණයක්.
- වාරික ආරක්ෂණ ප්‍රතිලාභය - ඔබ වියෝවුවහොත් හෝ නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට පත් වුවහොත්, AIA විසින් ඔබ වෙනුවෙන් වාරික ගෙවන අතර එමගින් ඔබේ ආදරණීයයන්ට ඔබ අදහස් කළ පරිදි කල්පිරීමේ වටිනාකම හිමි වනු ඇත.

# සැලසුමේ අන්තර්ගත රැකවරණ ප්‍රතිලාභ

## අවාසනාවන්ත වියෝවීමක දී



ජීවිත ප්‍රතිලාභ මුදල ඔබගේ ආදරණීයයන් වෙත වහාම ලැබෙනු ඇත.



වියෝවීම සිදුවන්නේ හදිසි අනතුරක් හේතුවෙන් නම්, ජීවිත ප්‍රතිලාභයට අමතරව හදිසි අනතුරු ප්‍රතිලාභ මුදල ලැබෙනු ඇත.




වියෝවීම සිදුවන්නේ වාරික ගෙවීමේ කාල සීමාව තුළ දී නම්, AIA විසින් ඔබ වෙනුවෙන් වාරික ගෙවමින් ඔබේ සැලසුම ඉදිරියටම පවත්වාගෙන යනු ඇත.




එමගින්, ඔබ ගොඩනැගීමට අදහස් කළ අරමුදල එලෙසම ඔබගේ ආදරණීයයන් වෙත ලැබෙනු ඇත. එම අරමුදල එකවර හෝ මාසික ආදායමක් ලෙස ලබා ගැනීමට තීරණය කිරීමේ නම්‍යශීලීතාවය ද ඔවුන්ට සැලසෙනු ඇත.

## හදිසි අනතුරක් හේතුවෙන් අවාසනාවන්ත ලෙස නිත්‍ය අකර්මන්‍යතාවයක් ඇති වුවහොත්



නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට ලක්වුවහොත්, රක්ෂණ ඔප්පුවේ සඳහන් කර ඇති ආකාරයට ඔබට අදාළ ප්‍රතිලාභය ලැබෙනු ඇත. නිත්‍ය අර්ධ අකර්මන්‍යතාවයකදී රක්ෂණ ඔප්පුවේ සඳහන් ඊට අදාළ ප්‍රතිලාභ මුදල ඔබට ලැබෙනු ඇත.




නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවය වාරික ගෙවීමේ කාල සීමාව තුළ සිදු වන්නේ නම්, AIA විසින් ඔබ වෙනුවෙන් වාරික ගෙවමින් ඔබේ සැලසුම ඉදිරියටම පවත්වාගෙන යනු ඇත. නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයට හේතු වූයේ අසනීපයක් වුවද ඉහත පැහැදිලි කළ ලෙසම AIA විසින් වාරික ගෙවමින් ඔබේ සැලසුම අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යනු ඇත.




එම නිසා, ඔබ ගොඩනැගීමට අදහස් කළ අරමුදල ඒ ආකාරයෙන්ම අනාගතයේ දී ඔබට භුක්ති විඳිය හැකිය. එමගින් එකවර හෝ මාසික ආදායමක් ලෙස එම අරමුදල ලබා ගැනීමේ නම්‍යශීලීතාවයද ඔබට හිමි වනු ඇත.

# ඔබට විශාල කල්පිරීමේ අරමුදලක් ලබා දෙන ලෝයල්ටි දීමනා!

ඔබ විසින් ඔබේ වාරික නියමිත දිනට ගෙවීමට දක්වන්නා වූ කැපවීම අගය කිරීමට, වසර 20 ක ඔප්පු කාල සීමාවක් සහිත සැලසුමකට එහි 15 වන සහ 20 වන ඔප්පු වර්ෂවල වාර්ෂික මූලික වාරිකයෙන් 450% ක් දක්වා ලෝයල්ටි දීමනාවක් ලබා දෙන අතර, වසර 10 සහ 15 ඔප්පු කාල සීමාවක් සහිත සැලසුම් සඳහා ලෝයල්ටි දීමනා කල්පිරීමේ දී ලැබෙනු ඇත.

| වාරික ගෙවීම් මාදිලිය | වසර 20 සැලසුම | | | | වසර 15 සැලසුම | වසර 10 සැලසුම |
|---|---|---|---|---|---|---|
| | 15 වන ඔප්පු වර්ෂය | | 20 වන ඔප්පු වර්ෂය | | 15 වන ඔප්පු වර්ෂය | 10 වන ඔප්පු වර්ෂය |
| | වසර 6 වාරික ගෙවීම | වසර 4 වාරික ගෙවීම | වසර 6 වාරික ගෙවීම | වසර 4 වාරික ගෙවීම | වසර 6 වාරික ගෙවීම | වසර 4 වාරික ගෙවීම |
| වාර්ෂිකව | 50% | 50% | 400% | 250% | 225% | 150% |
| අර්ධ වාර්ෂිකව | 50% | 50% | 400% | 250% | 225% | 150% |
| ත්‍රෛමාසිකව | 50% | 50% | 350% | 200% | 200% | 150% |
| මාසිකව | 50% | 50% | 300% | 200% | 175% | 150% |

## කල්පිරීමේදී එකවර මුදලක් හෝ ලාභාංශ වර්ධකය (Dividend Booster) මගින් ඉහළ නැංවූ මාසික ආදායමක් ලෙස

ඔබට ඔබේ කල්පිරීමේ ප්‍රතිලාභය, එකවර මුදලක් ලෙස හෝ වසර 5 සිට 30 ක් දක්වා මාසික ආදායමක් ලෙස ලබාගත හැකිය. කල්පිරීමේදී ඔබ මාසික ආදායම් විකල්පය තෝරා ගන්නේ නම්, ලාභාංශ වර්ධකය තුළින්, ඔබට ලැබෙන වාර්ෂික ලාභාංශ ප්‍රතිශතය අදාළ වර්ෂය සඳහා ප්‍රකාශිත ලාභාංශ ප්‍රතිශතයට වඩා 30% කින් වැඩි වේ.



## වාර්ෂිකව සහතික කරන ලද ලාභාංශ

AIA ස්මාර්ට් වෙල්ත් සෑම වසරකදීම ඔබේ අරමුදලේ අඛණ්ඩ වර්ධනය සහතික කරන අද්විතීය ලාභාංශ ක්‍රමවේදයක් ඉදිරිපත් කරයි. මෙය ප්‍රකාශිත ලාභාංශ අනුපාතය (ගාස්තු අය කිරීමෙන් පසු) හෝ වාර්ෂික සහතික කළ ලාභාංශ අනුපාතය (ගාස්තු අය කිරීමෙන් පසු) යන අගයන් අතුරින් ඉහළ අගය වනු ඇත.




## හදිසි මූල්‍ය අවශ්‍යතාවයකදී

වාරික ගෙවීමේ කාල සීමාව සම්පූර්ණ කිරීමෙන් පසු ඕනෑම වේලාවක ඔබේ අරමුදලේ පවතින වටිනාකමෙන් 15% ක් ආපසු ලබා ගත හැකිය. මෙය ඔබට ජීවිතයේ මුහුණ දීමට සිදුවිය හැකි අනපේක්ෂිත සිදුවීම් සැලකිල්ලට ගනිමින් අප විසින් ලබාදෙන නම්‍යශීලී පහසුකමක් වන අතර එය ඔප්පු කාල සීමාව තුළ එක් වරක් පමණක් ලබා දේ.



# AIA ස්මාර්ට් වෙල්ත් ප්‍රතිලාභ ලබාදෙන්නේ කෙසේද?

**නිදසුන 1:**

රජීව්ගේ වයස අවුරුදු 35 කි (ඊළඟ උපන්දිනය වන විට). විවාහකයෙක් වන ඔහු, තම බිරිඳ සහ දරුවන් දෙදෙනා සමඟ ජීවිතය සතුටින් ගත කරයි. ඔහු පහත සඳහන් ප්‍රතිලාභ සමඟ AIA ස්මාර්ට් වෙල්ත් සැලසුමක් මිලදී ගෙන ඇත.



| | |
|---|---|
| වාරික ගෙවීමේ කාල සීමාව - **වසර 6** | ජීවිත ප්‍රතිලාභය - **රු. මිලියන 2.5** |
| ඔප්පු කාල සීමාව - **වසර 20** | හදිසි අනතුරු ප්‍රතිලාභය - **රු. මිලියන 2.5** |
| වාර්ෂික වාරිකය - **රු. 250,000** | වාරික ආරක්ෂණ ප්‍රතිලාභය - **ඔව්** |

## රජීව්ට ඔහුගේ ධනය ගොඩනැගීමට, කළමනාකරණය කිරීමට සහ සුරක්ෂිත කිරීමට AIA ස්මාර්ට් වෙල්ත් උපකාරවන්නේ කෙසේද ?

**රජීව්ට ලැබෙන ආයෝජන ප්‍රතිලාභ**

කල්පිරීමේදී රජීව්ට හිමි වන නිදර්ශිත අරමුදල පහත පරිදි වේ.

| | උපකල්පිත ලාභාංශ අනුපාත | | |
|---|---|---|---|
| | **4% වාර්ෂිකව** | **8% වාර්ෂිකව** | **10% වාර්ෂිකව** |
| නිදර්ශිත කල්පිරීමේ අරමුදල (රු.) | 2,784,734 | 4,521,958 | 5,884,770 |

රජීව් ඔහුගේ කල්පිරීමේ ප්‍රතිලාභය මාසික ආදායමක් ලෙස වසර 15ක කාල සීමාවක් සඳහා ලබා ගන්නේ නම්, සෑම වර්ෂයකම ආරම්භයේ නිදර්ශිත මාසික ආදායම පහත පරිදි වනු ඇත (රු).

| **උපකල්පිත ලාභාංශ අනුපාත** | **4% වාර්ෂිකව** | **8% වාර්ෂිකව** | **10% වාර්ෂිකව** |
|---|---|---|---|
| **ලාභාංශ වර්ධකය (Dividend Booster) මගින් ඉහළ නැංවූ නිදර්ශිත ලාභාංශ අනුපාත** | **5.2% වාර්ෂිකව** | **10.4% වාර්ෂිකව** | **13% වාර්ෂිකව** |
| වයස අවුරුදු 56 දී | 15,471 | 25,122 | 32,693 |
| වයස අවුරුදු 61 දී | 19,233 | 39,820 | 58,262 |
| වයස අවුරුදු 66 දී | 23,911 | 63,116 | 103,829 |
| ආදායම් ලැබීමේ කාල සීමාව තුළදී ලැබෙනා මුළු ආදායම් වටිනාකම | 3,844,140 | 9,316,512 | 14,923,213 |

## රජීව්ට ලැබෙන රැකවරණ ප්‍රතිලාභ

3 වන ඔප්පු වර්ෂයේදී රජීව් අවාසනාවන්ත ලෙස හදිසි අනතුරකින් වියෝවුවහොත්, ඔහුගේ ආදරණීයයන්ට පහත රැකවරණ ප්‍රතිලාභ හිමි වනු ඇත.



ජීවිත ප්‍රතිලාභය ලෙස රු. 2,500,000 ක් වහාම රජීව්ගේ ආදරණීයයන් හට ලබාදෙනු ඇත.



හදිසි අනතුරු ප්‍රතිලාභය ලෙස රු. 2,500,000 ක් රජීව්ගේ ආදරණීයයන් හට ජීවිත ප්‍රතිලාභයට අමතරව ලබාදෙනු ඇත.




AIA විසින් රජීව් වෙනුවෙන් වාරික ගෙවා ඔහුගේ රක්ෂණ ඔප්පුව ඉදිරියට පවත්වාගෙන යනු ඇත.




ඔප්පු කාල සීමාව අවසානයේදී, රජීව් ගොඩනැගීමට අදහස් කළ අරමුදල ඒ ආකාරයෙන්ම ඔහුගේ ආදරණීයයන්ට ලැබෙනු ඇත. කල්පිරීමේදී එකවර මුදලක් ලෙස හෝ මාසික ආදායමක් ලෙස එම අරමුදල ලබා ගැනීමේ නම්‍යශීලීතාවයද ඔවුන්ට ලැබෙනු ඇත.

**නිදසුන 2:**
ගයාන්ගේ වයස අවුරුදු 40 කි (ඊළඟ උපන්දිනය වන විට). ඔහු විවාහ වී තම බිරිඳ සහ දරුවන් දෙදෙනා සමඟ ජීවිතය සතුටින් ගත කරයි. ඔහු පහත සඳහන් ප්‍රතිලාභ සමඟ AIA ස්මාර්ට් වෙල්ත් සැලසුම මිලදී ගෙන ඇත.



| | |
|---|---|
| වාරික ගෙවීමේ කාල සීමාව - **වසර 4** | ජීවිත ප්‍රතිලාභය - **රු. මිලියන 2** |
| ඔප්පු කාල සීමාව - **වසර 10** | හදිසි අනතුරු ප්‍රතිලාභය - **රු. මිලියන 2** |
| වාර්ෂික වාරිකය - **රු. 400,000** | වාරික ආරක්ෂණ ප්‍රතිලාභය - **ඔව්** |

# ගයාන්ට ඔහුගේ ධනය ගොඩනැගීමට, කළමනාකරණය කිරීමට සහ සුරක්ෂිත කිරීමට AIA ස්මාර්ට් වෙල්ත් උපකාර වී ඇත්තේ කෙසේද?

**ගයාන්ට ලැබෙන ආයෝජන ප්‍රතිලාභ**
කල්පිරීමේදී ගයාන්ට හිමිවන නිදර්ශිත අරමුදල පහත පරිදි වේ.

| | උපකල්පිත ලාභාංශ අනුපාත | | |
|---|---|---|---|
| | **4% වාර්ෂිකව** | **8% වාර්ෂිකව** | **10% වාර්ෂිකව** |
| නිදර්ශිත කල්පිරීමේ අරමුදල (රු.) | 1,903,502 | 2,409,706 | 2,721,034 |

ගයාන් ඔහුගේ කල්පිරීමේ ප්‍රතිලාභය මාසික ආදායමක් ලෙස වසර 15 ක කාලයක් සඳහා ලබා ගන්නේ නම්, සෑම වර්ෂයකම ආරම්භයේ නිදර්ශිත මාසික ආදායම පහත පරිදි වනු ඇත. (රු.)

| උපකල්පිත ලාභාංශ අනුපාත | 4% වාර්ෂිකව | 8% වාර්ෂිකව | 10% වාර්ෂිකව |
|---|---|---|---|
| **ලාභාංශ වර්ධකය (Dividend Booster) මගින් ඉහළ නැංවූ නිදර්ශිත ලාභාංශ අනුපාත** | **5.2% වාර්ෂිකව** | **10.4% වාර්ෂිකව** | **13% වාර්ෂිකව** |
| වයස අවුරුදු 51 දී | 10,575 | 13,387 | 15,117 |
| වයස අවුරුදු 56 දී | 13,147 | 21,219 | 26,940 |
| වයස අවුරුදු 61 දී | 16,344 | 33,634 | 48,009 |
| ආදායම් ලැබීමේ කාල සීමාව තුළදී ලැබෙනා මුළු ආදායම් වටිනාකම | 2,627,658 | 4,964,675 | 6,900,282 |

## ගයාන්ට ලැබෙන රැකවරණ ප්‍රතිලාභ

2වන ඔප්පු වර්ෂයේදී ගයාන් හදිසි අනතුරකින් නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට පත්වුවහොත්, ඔහුගේ ආදරණීයයන්ට පහත රැකවරණ ප්‍රතිලාභ හිමි වනු ඇත.



රු. 2,000,000ක මුදලක් රක්ෂණ ඔප්පුවේ සඳහන් ආකාරයට ගයාන්ට ලබා දෙනු ඇත.




AIA විසින් ගයාන් වෙනුවෙන් වාරික ගෙවා ඔහුගේ රක්ෂණ ඔප්පුව ඉදිරියට පවත්වාගෙන යනු ඇත.




ඔප්පු කාල සීමාව අවසානයේදී ගයාන් ගොඩනැගීමට අදහස් කළ අරමුදල ඒ ආකාරයෙන්ම ඔහුට සහ ඔහුගේ ආදරණීයයන්ට භුක්ති විඳීමට හැකි වනු ඇත. කල්පිරීමේ දී එකවර මුදලක් ලෙස හෝ මාසික ආදායමක් ලෙස එම අරමුදල ලබා ගැනීමට තීරණය කිරීමේ නම්‍යශීලීතාවයද ඔහුට හිමි වනු ඇත.

# සැලසුමට අදාළ වැදගත් තොරතුරු

| | |
|---|---|
| ඇතුළත් වීමේදී වයස | අවුරුදු 19 - 61 (ඊළඟ උපන්දිනය වන විට) |
| උපරිම කල්පිරීමේ වයස | අවුරුදු 76 (ඊළඟ උපන්දිනය වන විට) |

| | |
|---|---|
| වාරික ගෙවීමේ කාල සීමාව | අවුරුදු 4 හෝ අවුරුදු 6 |
| රක්ෂණ කාල සීමාව | විකල්පය 1 - අවුරුදු 20 (අවුරුදු 6ක් ගෙවීම සහ අවුරුදු 4ක් ගෙවීම) |
| | විකල්පය 2 - අවුරුදු 15 (අවුරුදු 6ක් ගෙවීම පමණයි) |
| | විකල්පය 3 - අවුරුදු 10 (අවුරුදු 4ක් ගෙවීම පමණයි) |
| මාසික ආදායම් කාල සීමාව | වසර 05 සිට 30 දක්වා |

| | |
|---|---|
| අවම මුළු වාර්ෂික වාරිකය | වසර 4 ක වාරික ගෙවීමේ කාල සීමාවට - රු. 100,000 |
| | වසර 6 ක වාරික ගෙවීමේ කාල සීමාවට - රු. 75,000 |

| | |
|---|---|
| වාරික ගෙවීම් මාදිලිය | වාර්ෂිකව, අර්ධ වාර්ෂිකව, ත්‍රෛමාසිකව සහ මාසිකව |

# අදාළ ගාස්තු

| ඔප්පු වර්ෂය | | 1 වන | 2 වන | 3 වන | 4 වන | 5 වන | 6 වන |
|---|---|---|---|---|---|---|---|
| වාර්ෂික මූලික වාරිකය සඳහා වන වෙන්කිරීමේ ගාස්තුව | වසර 6 වාරික ගෙවීම | 60% | 25% | 15% | 10% | 5% | 5% |
| | වසර 4 වාරික ගෙවීම | 60% | 25% | 15% | 10% | - | - |

| ඔප්පු වර්ෂය | 1 වන | 2 වන | 3 වන | වසර 4 - 10 | 11 වන වසරේ සිට |
|---|---|---|---|---|---|
| පවාරණ ගාස්තු | 100% | | | 100% - 0%* | 0% |

*වසරක් පාසා මෙය සමානුපාතිකව පහත බසිනු ඇත.

### පරිපාලන ගාස්තුව

2021 වර්ෂය සඳහා රු 1,224 ක් වන අතර, සෑම වසරකම ජනවාරි 1 වැනි දින වසරකට 15% බැගින් ඉහළ යයි.

### වාරික මාදිලි ගාස්තුව

මාසික වාරික මාදිලිය සඳහා පමණක් 4%.

### අරමුදල් කළමනාකරණ ගාස්තු

රක්ෂණ ඔප්පුවේ කාල සීමාව මෙන්ම මාසික ආදායම් ලබන කාලය තුළ ද ආයෝජන ගිණුමේ ශේෂය මත වාර්ෂිකව 0.75% ක ගාස්තුවක් අය කෙරේ.

# නිතර අසනු ලබන ප්‍රශ්න

## 1. AIA ස්මාර්ට් වෙල්ත් යනු කුමක්ද?

AIA ස්මාර්ට් වෙල්ත් යනු කෙටි කාලීන වාරික ගෙවීමේ කාල සීමාවක් සහිත ජීවිත රක්ෂණ සැලැස්මකි. එමගින් ඔබේ ධනය ගොඩනැගීම, කළමනාකරණය කිරීම සහ සුරක්ෂිත කිරීම මෙන්ම, දීර්ඝ කාලීන රක්ෂණ ප්‍රතිලාභද සලසයි.

## 2. AIA ස්මාර්ට් වෙල්ත් සැලැස්මක් මිලදී ගැනීමේදී ඒ සඳහා කොපමණ කාලයක් වාරික ගෙවිය යුතුද?

ඔබ වාරික ගෙවිය යුත්තේ වසර 4 ක් හෝ 6 ක් පමණි. නමුත් වසර 20 ක් දක්වා රැකවරණයක් ඔබට හිමි වනු ඇත.

## 3. මා සතුව ඉතුරුම් දැනටමත් පවතින බැවින් මට මෙය අවශ්‍ය වන්නේ ඇයි?

ආයෝජනය කිරීමට සහ ඉතිරි කිරීමට ඔබට බොහෝ විකල්ප තිබේ. නමුත් ඔබේ ඉතිරි කිරීම් ගොඩනගමින් රැකවරණයද සපයන එකම විකල්පය ජීවිත රක්ෂණයයි. AIA ස්මාර්ට් වෙල්ත් යනු රැකවරණය සහ ඉතිරි කිරීමේ ප්‍රතිලාභ යන ද්විත්වයම ලබාදෙන විශිෂ්ට ජීවිත රක්ෂණ සැලසුමකි.

## 4. මට තෝරාගත හැකි වාරික ගෙවීමේ කාල සීමා සහ රක්ෂණ කාල සීමා විකල්ප මොනවාද?

4 ගෙවීම 10 (වාරික ගෙවීමේ කාල සීමාව වසර 4 ක් වන අතර ඔප්පු කාල සීමාව වසර 10 කි).

4 ගෙවීම 20 (වාරික ගෙවීමේ කාල සීමාව වසර 4 ක් වන අතර ඔප්පු කාල සීමාව වසර 20 කි).

6 ගෙවීම 15 (වාරික ගෙවීමේ කාල සීමාව වසර 6 ක් වන අතර ඔප්පු කාල සීමාව වසර 15 කි).

6 ගෙවීම 20 (වාරික ගෙවීමේ කාල සීමාව වසර 6 ක් වන අතර ඔප්පු කාල සීමාව වසර 20 කි).

## 5. මා මිය ගියහොත් කුමක් සිදුවේද?

ඔබ අනපේක්ෂිත ලෙස වියෝවුවහොත්, ඔබගේ ආදරණීයයන්ට වහාම ජීවිත ප්‍රතිලාභ මුදල හිමි වනු ඇත. මරණය හදිසි අනතුරක් නිසා සිදුවුයේ නම්, ජීවිත ප්‍රතිලාභ මුදලට අමතරව හදිසි අනතුරු ප්‍රතිලාභ මුදලද ගෙවනු ලැබේ.

වාරික ගෙවීමේ කාල සීමාව තුළ මරණය සිදු වුයේ නම්, AIA විසින් ඔබ වෙනුවෙන් ඔබේ ඉතිරි වාරික ගෙවා ඔබේ රක්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත. ඒ තුළින්, ඔබ ගොඩනගා ගැනීමට අදහස් කළ අරමුදල, ඔබ නොමැති වුවත් ඒ ආකාරයෙන්ම ඔබගේ ආදරණීයයන් හට භුක්ති විදීමට හැකි වනු ඇත. එසේ හිමි වන කල්පිරීමේ ප්‍රතිලාභය එකවර මුදලක් ලෙස හෝ මාසික ආදායමක් ලෙස ලබාගැනීමේ නම්‍යශීලීතාවයද මෙමගින් ඔවුන්ට සැලසෙයි.

## 6. AIA ස්මාර්ට් වෙල්ත් මගේ අරමුදල ගොඩනඟන්නේ කෙසේද?

ඔබ ගෙවන මූලික වාරිකය පළමු දිනයේ සිට ඔබේ ආයෝජන ගිණුමට බැර කෙරෙන බැවින් (වෙන් කිරීමේ ගාස්තු අඩු කිරීමෙන් පසු) ඔබේ අරමුදල ගොඩනැගීම ඔබේ පළමු වාරික ගෙවීම සමගින්ම ආරම්භ වේ. ඊට අමතරව, ඔප්පු කාල සීමාව අවසානයේ දී, ඔබට ඉහළ අරමුදලක් හිමිකරදීම සඳහා, ආරම්භයේ සිටම ආකර්ෂණීය වාර්ෂික ලාභාංශ වැල් පොලී ක්‍රමයට ඔබේ අරමුදලට එකතු කරනු ලැබේ.

## 7. AIA ස්මාර්ට් වෙල්ත් මගේ අරමුදල සඳහා ලාභාංශ සහතික කරන්නේද?

සෑම වසරකම වාර්ෂික ලාභාංශ මගින් ඔබේ අරමුදල වර්ධනය කෙරෙනු ඇත. මෙසේ සහතික කළ ලාභාංශ යනු ඔබේ අරමුදලට හිමිවන අවම ලාභාංශයයි. කෙසේ වෙතත්, සැබැවින් ප්‍රකාශයට පත් කෙරෙන ලාභාංශ අනුපාතය, වාර්ෂිකව සහතික කළ ලාභාංශ අනුපාතයට වඩා වැඩි වන්නේ නම්, ඔබට එම ඉහළ ලාභාංශ අනුපාතය හිමි වනු ඇත. එමගින් කල්පිරීමේදී ඔබට විශාල අරමුදලක් තහවුරු කෙරේ.

## 8. පසුගිය වර්ෂවලදී AIA විසින් ගෙවා ඇති ලාභාංශ අනුපාත මොනවාද?

පසුගිය වර්ෂවලදී මෙම සැලැස්මට සමාන වෙනත් රක්ෂණ සැලසුම් සඳහා ප්‍රකාශිත ලාභාංශ අනුපාත සහ ඒ ඒ වර්ෂයට අදාළ වූ අවම සහතික කළ ලාභාංශ අනුපාත පහත දැක්වේ:

| වර්ෂය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|---|---|
| අවම සහතික කළ ලාභාංශ අනුපාතය | 8% | 8% | 8% | 8% | 8% | 8% | 8% | 8% | 8% |
| ප්‍රකාශයට පත් කළ සැබෑ ලාභාංශ අනුපාතය | 9.62% | 9.88% | 9.55% | 9.46% | 9.63% | 9.37% | 9.99% | 9.18% | |

සටහන:

ජීවිත අරමුදලේ අපේක්ෂිත ඉපැයීම් මත පදනම්ව අවම වශයෙන් සහතික කළ ලාභාංශ අනුපාතය සහ වාර්ෂිකව ප්‍රකාශයට පත් කළ සැබෑ ලාභාංශ ඉපයීම් අනුපාතය වෙනස් විය හැකි අතර, අතීතයේ ප්‍රකාශිත ලාභාංශ අනුපාතයන්ට වඩා ඒවා අඩු, ඉහළ හෝ සමාන විය හැකි බව කරුණාවෙන් සලකන්න.

## 9. AIA ස්මාර්ට් වෙල්ත් සලසන රැකවරණ ප්‍රතිලාභ මොනවාද?

- ජීවිත ප්‍රතිලාභය
- හදිසි අනතුරු ප්‍රතිලාභය: හදිසි අනතුරක් හේතුවෙන් සිදු වන මරණයක දී, නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකදී සහ නිත්‍ය අර්ධ අකර්මන්‍යතාවයකදී හිමි වන ප්‍රතිලාභ
- වාරික ආරක්ෂණ ප්‍රතිලාභය

## 10. මට මෙම රක්ෂණ සැලසුමෙන් මුදල් ආපසු ලබා ගත හැකිද?

ඔප්පු කාල සීමාව තුළ එක් වතාවකට පමණක්, වාරික ගෙවීමේ කාල සීමාව සම්පූර්ණ කිරීමෙන් පසු ඔබේ අරමුදල් වටිනාකමෙන් 15% ක් ආපසු ලබා ගත හැකිය.

## 11. වාර්ෂික මූලික වාරිකය සහ මුලු වාර්ෂික වාරිකය අතර වෙනස කුමක්ද?

වාර්ෂික මූලික වාරිකය යනු ජීවිත ප්‍රතිලාභය, හදිසි අනතුරු ප්‍රතිලාභය සහ වාරික ආරක්ෂණ ප්‍රතිලාභය සඳහා අදාළ අවදානම් ගාස්තු ඇතුළත් නොවන වාරිකයයි. ඔබේ අරමුදල ගොඩනැගීම සඳහා මෙම වාරිකය වෙන් කිරීමේ ගාස්තු අය කිරීමෙන් පසුව ඔබේ ආයෝජන ගිණුමට බැර කරනු ලැබේ.

මුලු වාර්ෂික වාරිකය යනු ඔබේ රක්ෂණයේ ඉතිරි කිරීම් සහ රැකවරණ ප්‍රතිලාභ සඳහා වන සම්පූර්ණ වාරිකයයි. එනම් ඔබේ ආයෝජන ගිණුමට බැර කර ඇති වාරිකය මෙන්ම ජීවිත ප්‍රතිලාභය, හදිසි අනතුරු ප්‍රතිලාභය සහ වාරික ආරක්ෂණ ප්‍රතිලාභය සඳහා වන වාරිකද මෙයට ඇතුළත් වේ.

## 12. මට AIA ස්මාර්ට් වෙල්ත් සැලසුමක් මිලදී ගත හැක්කේ කෙසේද?

ඔබේ AIA වෙල්ත් ප්ලෑනර්වරයා, බලයලත් තැරැව්කරු හෝ 0112 310 310 අමතා මිලදී ගැනීමට අදාළ විස්තර ලබා ගත හැකය.

## නියමයන් සහ කොන්දේසි

මෙම සැලසුම ලබා ගත හැක්කේ AIA වෙල්ත් ප්ලෑනර්වරයෙකු හෝ බලයලත් තැරැව්කරුවෙකුගෙන් පමණි.

ඕනෑම රක්ෂණ සමාගමක් සහ / හෝ ඕනෑම රක්ෂණ සැලසුමක් තෝරා ගැනීමේ අයිතිය ඔබ සතු වේ. තවද බැංකුවක් හෝ වෙනත් ඕනෑම ආයතනයක් විසින් තම මූල්‍ය සේවාවන් තුල අන්තර්ගත කර ඇති හෝ බැඳී ඇති ඕනෑම රක්ෂණ සැලසුමක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතියද ඔබ සතුවේ.

මෙය සැලසුමේ දළ විශ්ලේෂණයක් පමණි. නියමයන් සහ කොන්දේසි අදාළ වේ. සම්පූර්ණ සැලසුමේ විස්තර, නියමයන් සහ කොන්දේසි සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුව බලන්න. ඔබේ යෝජනා පත්‍රයට අත්සන් කිරීමට පෙර ඔබට විකුණුම් නිදර්ශනයක් - මිල කැඳවුමක් ලබා දෙනු ඇති අතර එමඟින් සැලසුමේ විශේෂාංග සහ ආවරණයන් තවදුරටත් විස්තර කෙරේ.

ජීවිත රක්ෂිතයා රක්ෂණාවර හිමියා නොවන්නේ නම් මෙම රක්ෂණාවරය මගින් සපයනු ලබන ප්‍රතිලාභ රක්ෂණාවර හිමියා වෙත අදාළ වන අතර ආවරණයන් ජීවිත රක්ෂිතයා වෙත අදාළ වේ.

SW - 300000381
V1 - 04/21

AIA Insurance Lanka Limited (Co.No.PQ 18 PB) විසින් නිකුත් කරන ලදී. 04/16/2021

HEALTHIER, LONGER,
BETTER LIVES